**මාත්තෙයි බටහිර ප්‍රාදේශීය සභාව**
**මන්නාරම දිස්ත්‍රික්කය**
**----------------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන
**---------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**---------------------------------**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 අගෝස්තු 21 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
**------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට මාත්තෙයි බටහිර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
**----------------------------------------**

#### 1.3.1 නොසැසඳුනු ගිණුම්
**---------------------**

පහත කරුණු නිරීක්ෂණ විය.

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ ආදායම් ණයගැතියෝ සහ සමුච්චිත අරමුදල් ගිණුම්වල සමාලෝචිත වර්ෂය ආරම්භට හිඟ ශේෂ ඉකුත් වර්ෂයේ අවසන් ශේෂය සමඟ නොසැසදීමෙන් රු. 7,593,497 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු උසාවි දඩ රු. 3,953,504 ක් ලෙස දක්වා තිබුණද, ආදායම් ලේඛනය අනුව එය රු.4,709,421 ක් ලෙස දක්වා තිබීමෙන් රු. 755,917 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල සේවක ණය ශේෂය රු. 6,783,954 ක් ලෙස දක්වා තිබුණද, ණය ලේඛනය අනුව ණය රු. 6,782,130 ක් ලෙස දක්වා තිබීමෙන් රු. 1,824 ක වෙනසක් නිරීක්ෂණය විය.

#### 1.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
**------------------------------------**

**ලැබිය යුතු ගිණුම්**
**-------------------**

සමාලෝචිත වර්ෂයේ හිඟ ආදායම් ණය ගැතියන්ගෙන් ලැබියයුතු රු. 1,872,004 ක මුදල අයකර ගැනීම සඳහා සභාව විසින් අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

**1.3.3 අනුකූල නොවීම්**

**-------------------**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

**---------------------------------------------------------------------------**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| -------------------------------------- | ------------ | ------------------ |
| | රු. | |
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | |
| රීති 178(3) | - | කොන්ත්‍රාත් වැඩ සාර්ථකව ඉටුකරන ප්‍රජා සංවිධාන, ප්‍රජා මධ්‍යස්ථානවල නම් ඇතුලත් ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි<br>------------------------------- | | |
| මුදල් රෙගුලාසි 571 | 592,449 | වර්ෂ දෙකක් කල් ඉකුත්වූ තැන්පත් සම්බන්ධයෙන් සභාව විසින් අවශ්‍ය කටයුතු කර නොතිබුණි. |

**2 මූල්‍ය සමාලෝචනය**

**----------------------**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

**--------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම් රු. 4,764,589 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 2,063,607 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**----------------------**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

**---------------------------------------------------------------------------------**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | කුලී | 8,623,000 | - | 8,077,925 | 460,743 | 7,022,000 | - | 8,921,915 | 502,320 |
| (ii) | බලපත්‍ර ගාස්තු | 597,250 | - | 710,640 | - | 503,500 | - | 1,874,720 | - |
| (iii) | වෙනත් ආදායම් | 10,801,139 | - | 11,429,909 | 15,042,020 | 11,179,849 | - | 15,651,868 | 16,738,006 |

### 2.2.2 බලපත්‍ර ගාස්තු

පහත නිරීක්ෂණයන් කරුණු ලැබේ.

(අ) රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවලින් ඉදිකර භාරදී තිබු නිවාස 131 ක් සඳහා ඉදිකිරීමට අදාල බලපත්‍ර ගාස්තු අයකර ගැනීම සඳහා සභාව විසින් ක්‍රියාකර නොතිබීමෙන් සභාවට රු. 785,400 ක පාඩුවක් සිදුවී තිබුණි.

(ආ) පසුගිය වර්ෂ 01 සිට වර්ෂ 06 දක්වා කාලයතුල සභා බලප්‍රදේශයේ ඉදිකර තිබු නිවාස 6,569 ක් ආදායම් පරික්ෂකවරුන් විසින් නිසි ලෙස පරික්ෂා නොකිරීමෙන් සභාවට ලැබියයුතු රු. 14,080,200 ක පරික්ෂණ ගාස්තු ආදායම් මුදල ලබා ගැනීමට සභාවට නොහැකිවී තිබුණි.

### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

උතුරු පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු. 4,709,421 ක් හා මුද්දර ගාස්තු රු. 2,746,755 ක් විය.

## 3 මෙහෙයුම් සමාලෝචිතය

### 3.1 කාර්‍ය සාධනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

#### (අ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

සභා බල ප්‍රදේශයෙන් ඉවත් කරන කැලිකසල පිළිස්සීම සහ පස්වලින් යටකිරීම යන ක්‍රියාමාර්ග පමණක් සභාව විසින් සිදුකර තිබූ අතර කොම්පෝස්ට් සහ ප්‍රතිචක්‍රීයකරණය වැනි ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සභාව විසින් කර නොතිබුණි.

#### (ආ) අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

පහත කරුණු නිරීක්ෂණ විය.

(i) සමාලෝචිත වර්ෂයේදී නිලධාරින්ට පුහුණුව ලබාදීම සඳහා සභා අරමුදලින් රු. 50,000 වෙන්කර තිබුණද, අවශ්‍ය පුහුණු ලබාදී නොතිබුණි.

(ii) අඩු ආදායම්ලාභි හා පෝෂණය අඩු මට්ටමක පවතින මව්වරුන් හා ළදරුවන්ගේ සුභසාධනය සම්බන්ධයෙන් සභාව විසින් අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

**(ආ) අත්හැරුණු ව්‍යාපෘති**

**-------------------------**

පහත කරුණ නිරීක්ෂණ විය.

(අ) සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය අනුව සහා අරමුදලින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබු එකතුව රුපියල් මිලියන 6.7 ක් වටිනා ප්‍රාග්ධන සහ සුභසාධන වැඩ සටහන් 11 ක් සම්පූර්ණයෙන්ම අත්හැර දමා තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයේ සැලසුම් කර තිබුණද, ක්‍රියාත්මක කර නොතිබු රුපියල් මිලියන 3.95 ක් වටිනා ප්‍රාග්ධන වැඩ 6 ක් සමාලෝචිත වර්ෂයේදී ද සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

**3.2 මානව සම්පත් කළමනාකරණය**

**----------------------------------**

සභාවේ පුරප්පාඩු වී තිබූ සේවක මණ්ඩල පුරප්පාඩු 09 පිරවීමට කටයුතු නොකිරීමෙන් ඒ අයගෙන් ලබාගත හැකිව තිබූ වැඩවලට පාඩු සිදුවී තිබූ බව නිරීක්ෂණය විය.

**3.2.1 හඳුනාගත් පාඩු**

**-----------------**

සමාලෝචිත වර්ෂයේ ධාවනයේ යෙදවූ බැකෝ ලෝඩරය වෙනුවෙන් රු. 56,211 ක් වටිනා ඩීසල් ලීටර් 591 අඩුවීම ඌනතාවය සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

**4 ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**----------------------------------------**

**4.1 අභ්‍යන්තර විගණනය**

**-----------------------**

සභාවේ කටයුතු විගණනය කර එහි ක්‍රියාකාරකම් කාර්යක්ෂමතාවයෙන් කරගෙන යාම සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා තිබුණද, සමාලෝචිත වර්ෂයේදී අභ්‍යන්තර විගණන පරික්ෂණ වලින් ලද නිර්දේශයන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**4.2 අයවැය පාලනය**

**-------------------**

සමාලෝචිත වර්ෂයේ අයවැයගත සහ තථ්‍ය වියදම් අතර රුපියල් මිලියන 2.2 ක අහිතකර විචලනයක් නිරීක්ෂණය විය.

**5 පද්ධති හා පාලන**

**-------------------**

විගණනයේ නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

.

| පද්ධතිය | අඩුපාඩු |
| --- | --- |
| (අ) ආදායම් | දේපළ තක්සේරුකර වරිපනම්බදු අයකර ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. |
| (ආ) වත්කම් | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි, මාර්ග, සුසානභූමි, සාතකාගාර බලපත්‍ර ගාස්තු ලේඛන ගත කර නොතිබුණි. |
| (ඇ) ගිණුම්කරණය | පොදු ලෙජරය සහ ප්‍රධාන ලෙජරය යාවත්කාලීනව පවත්වා නොතිබුණි. |